60

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ**
**ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි,**
**නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි හා ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහාවන**
**බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.**

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප)
යොමු අංකය : LGD/2/21/3/6 – II වෙළුම
දිනය : 2018.05.29

1.2 අමාත්‍යාංශය : පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
යොමු අංකය : CM/WP/E15/5/1-26
දිනය : 2018.06.19

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම
යොමු අංකය : DMS/WP/0601
දිනය : 2015.03.18

1.4 ප්‍රධාන ලේකම් (බ.ප) ගේ නිර්දේශ
යොමු අංකය : CSWP/PTR/15-3/FI/28(A)
දිනය : 2018-06-29

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය :
දිනය :

1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය :
දිනය :

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය
යොමු අංකය :
දිනය :

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : ........
දිනය : 2018/7/18

**02.** පත්කිරීම් බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ක්‍රියාත්මකවන දිනය : ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ

**03.** සේවා ගණය පිළිබඳ විස්තර -

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණිය : III/ II/ I

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය

ගිනි නිවාරණ හා මෙහෙයුම් කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/අණ දීම,කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන් ඇතුළත්වූ ද, ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතුරින් තනතුර නිශ්චිත කොට පවරා දෙනු ලබන කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ගිනි නිවීම් සේවා නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුර/තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL-1- 2016 (රා.ප.ච. 03/2016 අනුව)

5.2 වැටුප් පරිමාණය : රු. 47615 - 10 X 1335 - 8 X 1630 - 17 X 2170 - 110895/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III ශ්‍රේණිය | පියවර 01 | රු. 47,615/- |
| II ශ්‍රේණිය | පියවර 12 | රු. 62,595/- |
| I ශ්‍රේණිය | පියවර 20 | රු. 76,175/- |

සටහන :

බඳවා ගැනීම්, උසස් කිරීම්වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේ දී අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 01 හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ යුතුය. එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ, උපලේඛන 02 හි සඳහන් පරිදි බැව් අදාළ පත්වීම් ලිපියෙහි සඳහන් කළ යුතුවේ.

**06.** සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම , අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාමය | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | III | 03 | i. ගිනි නිවීම් සේවයේ අතුරු ව්‍යවස්ථා යථාවත් කිරීමට අවශ්‍ය තොරතුරු හා දත්ත රැස්කර තැබීම සහ ඒවා යථාවත් කිරීම අවශ්‍ය අවස්ථාවල දී ප්‍රධානීන් සමඟ සාකච්ඡා පවත්වා ඉදිරි කටයුතු කිරීම.<br>ii. ප්‍රාදේශීය නිලධාරින් විසින් යෝජිත ගොඩනැගිලි සැලසුම් සඳහා ලබා දෙන ගිනි ආරක්ෂක අවශ්‍යතාවයන් පරීක්ෂා කර,නිවැරදි කිරීම් සිදු කර අනුමැතිය සඳහා නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී මඟින් ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී වෙත යොමු කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ........
දිනය : ........

| | | | |
|---|---|---|---|
| | | | iii. මෙහෙයුම් අංශයට අදාළ සියලුම රථවාහන, උපකරණ හා යන්ත්‍රසූත්‍ර නිසි ක්‍රියාකාරීත්වයෙන් පවත්වා ගැනීම පිළිබඳ අධීක්ෂණය කිරීම.<br>iv. ගිනි නිවන කණ්ඩායම් සම්බන්ධව පැන නගින ගැටළු නිරාකරණය කර සේවයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීමට කටයුතු කිරීම.<br>v. ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ බාහිර ආයතන සඳහා පුහුණු කිරීමේ පාඨමාලා සංවිධානය කිරීම සහ අදාළ පුහුණු කිරීමේ ආයතනවල සිදු කරනු ලබන ගිනි නිවීම් සේවාව පිළිබඳ කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ අධීක්ෂණය කිරීම.<br>vi. ගොඩනැගිලිවල ගිනි ආපදා අවස්ථාවල දී එම ගොඩනැගිලිවල සිටින පුද්ගලයින් ඉවත් කිරීම සම්බන්ධ සරඹ සංවිධානය කිරීම (Fire Evacution Drill)<br>vii. ආයතන ප්‍රධාන/ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් තනතුරට අදාළව පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටු කිරීම |
| නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | II | 01 | i. ගොඩනැගිලි සැලසුම්වලට අදාළ ගිනි ආරක්ෂණ අවශ්‍යතාවයන් කාලීනව යථාවත් කිරීම සඳහා සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරින් සමඟ කමිටු පවත්වා එම කමිටුවල නිර්දේශයන් ප්‍රධාන ගිනි නිවීම් නිලධාරිගේ අනුමැතිය සඳහා යොමු කිරීම.<br>ii. අනුමැතිය සඳහා බාහිර පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජිත ගොඩනැගිලි සැලසුම්වල ඇති ගැටළු නිරාකරණය කර ගැනීමට ඒ සම්බන්ධව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් විනිශ්චය කමිටු (Referee Committee) පවත්වා එම නිර්දේශයන් ප්‍රධාන ගිනි නිවීම් නිලධාරිගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : CS/A2/~/1/3.2.8
දිනය : 2018/2/1.8

| | | | |
|---|---|---|---|
| | | | iii. උස් ගොඩනැගිලි සම්බන්ධයෙන් සිදු කරන පරික්ෂාවන්,ගිනි සරඹ, ගොඩනැගිලිවලින් ඉවත්වීමේ සරඹ යනාදියේ දී එම කාර්යයන් සඳහා ඍජුවම සම්බන්ධ වී අවශ්‍ය උපදෙස් ලබා දීම සහ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |
| | | | iv. මෙහෙයුම් අංශයේ ක්‍රියාකාරීත්වය (දෛනික පුහුණු වීම් ,උපකරණ හා වාහන නඩත්තුව, නගරයෙන් පිටත ගිනි නිවීම් කටයුතු ද , නගරය තුළ සිදු විය හැකි රසායනික අනතුරු වලක්වා ගැනීම කාර්යක්ෂමව සිදු කිරීම සම්බන්ධයෙන් අංශ ප්‍රධානින් සමඟ සාකච්ඡා පවත්වා තීන්දු තීරණ ගැනීම. |
| | | | v. ගිනි නිවීම් සේවාවේ උසස් පුහුණු අවශ්‍යතාවයන් පිළිබඳ උපදෙස් ලබා දෙමින් පුහුණු පාඨමාලා යථාවත් කිරීමට කටයුතු කිරීම. |
| | | | vi. ගිනි නිවීම් සේවයට අයත් ප්‍රතිපත්ති කාලානුරූපව යථාවත් කිරීම හා ඒ පිළිබඳ අධීක්ෂණය කර ,සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරින්ට අවශ්‍ය උපදෙස් ලබා දීම. |
| | | | vii. කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ හා ඉන් පිටත සිදු වන මහා පරිමාණ ඉදිකිරීම් (වෙළෙඳ හා කාර්මික) තුළ සිදු විය හැකි අවදානම් තත්ත්වයන්ට මුහුණ දිය හැකි ආකාරයේ සැලසුම් සකස් කිරීම.(කාර්ය මණ්ඩල, වාහන, උපකරණ) |
| ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. ගොනු අංකය : ලේ.ස්./ආ.2/24/4/1/2/338 දිනය : 2019/2/18 | | | viii. මහා පරිමාණ ගිනි අනතුරු ඇතිවන අවස්ථාවන්හි දි සිද්ධි පාලනය කිරීම සඳහා භාවිතා කළහැකි,තාක්ෂණ ක්‍රමවේදයන් , වාහන, යන්ත්‍ර , උපකරණ හා සහායක සේවාවන් පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කර සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරින් හට (මෙහෙයුම්, පුහුණු නිවාරණ) අවශ්‍ය උපදෙස් ලබා දීම හා ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි දැනුවත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | | ix. සියලුම කාර්යය මණ්ඩල සුභසාධනය සම්බන්ධ කටයුතු අධීක්ෂණය කර ,අවශ්‍ය උපදෙස් ලබා දී සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරීන් ව දැනුවත් කිරීම.<br>x. ආයතන ප්‍රධාන/ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් තනතුරට අදාළව පවරනු ලබන ඕනෑම රාජකාරී ඉටු කිරීම. |
| ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | I | 01 | i. ගිනි නිවීම් හා ජීවිත බේරා ගැනීම් කටයුතුවලට අදාළ සියලුම අංශවල (මෙහෙයුම්, පුහුණු, නිවාරණ) ප්‍රතිපත්ති සම්පාදනය, විධානය සහ පරිපාලනය කිරීම.<br>ii. පළාත් පාලන ආයතනයේ බලධාරීන් සහ ආයතන ප්‍රධානීන් සමඟ පළාත් පාලන ආයතනයේ සංයුක්ත සැලැස්මට අනුව ප්‍රතිපත්තිවලට අදාළ සියලු කරුණු සම්බන්ධීකරණය කිරීම, තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.<br>iii. මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා නගර සභා සීමාව තුළ ඉදිවෙන ගොඩනැගිලි වෙනුවෙන් සැලසුම් අනුමත කිරීමේ කමිටු සඳහා ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා දීම.<br>iv. ස්වභාවික සහ හදිසි ආපදාවන්හිදී මිනිස් ජීවිතවලට, දේපළවලට සහ පරිසරයට සිදුවිය හැකි හානිය අවම කර ගැනීමට සහ වලක්වා ගැනීමට අදාළ සැලසුම් කිරීම, එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ අදාළ උපදෙස් ලබා දීම.<br>v. ජාතික වශයෙන් සම්බන්ධ ක්‍රියාකාරකම්වලදී ගිනි ආරක්ෂාව පිළිබඳ තීරණ ගැනීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ............
දිනය : ............

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

| | |
|---|---|
| ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | 01 |
| සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | 03 |

(ශ්‍රේණිගත උසස්වීම් සඳහා සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී III/II/I ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් සේ සැලකේ.)

**07.** බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100 % |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් : -

i. එක්සත් රාජධානියේ ගිනි ඉංජිනේරුවන්ගේ ආයතනයේ උපාධිත්ව විභාග සහතිකය (Graduateship Examination Certificate of the Institution of Fire Engineers - UK)

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව විද්‍යාවේදී උපාධිය

(අ) බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයක ගිනි නිවීම් සේවා ඒකකයක/ දෙපාර්තමේන්තුවක ඉහත (i) හෝ (ii) සුදුසුකම් ලැබූ ගිනිභට හෝ ඊට ඉහළ තනතුරක වසර දහය(10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියෙකු වීම

හෝ

(ආ) තනතුරේ ස්ථිර කරන ලද වසර තුන(03)ක සේවා කාලයක් ඇති ප්‍රාදේශීය ගිනි නිවීම් නිලධාරියෙකු වීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : .......
දිනය : .......

7.3.2.2 පළපුරුද්ද : අදාළ නොවේ.

7.3.2.3 කායික සුදුසුකම්

තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.4 වෙනත් :

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන්වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස

| | | |
|---|---|---|
| 7.3.3.1 | අවම සීමාව | දැනටමත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු වූවන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ. |
| 7.3.3.2 | උපරිම සීමාව | |

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

බඳවා ගැනීම සඳහා ලිඛිත පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා භාජනය කරනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනු පිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

සංලක්ෂ්‍යය :
පළමු වතාවට පමණක් මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මකවන දිනට ප්‍රාදේශීය නිලධාරි තනතුරේ සේවයේ නියුතු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති පූර්වාසන්නතම වසර පහ (05)ක සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් ඇති නිලධාරීන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පමණක් භාජනය කර සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ගිනි නිවීම් සේවා ඉංජිනේරු, මෙහෙයුම් හා ගිනි සුරක්ෂිතතාව | 100 | 40 |
| ඉංග්‍රීසි භාෂා හැකියාව | 100 | 40 |

(විභාග විෂය නිර්දේශය උපලේඛන අංක 01හි දැක්වේ)

7.3.4.1.1 පවත්වන බලධරයා :

පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

- බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ ද තහවුරු කර ගැනීම හා අදාළ රාජකාරිය ඉටු කිරීම සඳහා යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව තහවුරු කර ගැනීම සඳහා පමණක් පැවැත්වේ.
- සම්මුඛ පරීක්ෂණයෙදී ලකුණු ලබා දෙනු නොලැබේ.
- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දීම සිදු කරනු ලැබේ

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත්කිරීම් බලධරයා

7.3.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ඉංග්‍රීසි මාධ්‍යයෙන් රාජකාරි විෂයට අදාළව අසනු ලබන ප්‍රශ්න සඳහා | 40 | 40 |
| සේවා කාලය තුළ ඇගයීම් හා ආයතනයට දක්වන ලද දායකත්වයන් සඳහා | 30 | |
| සේවා පරිසරයෙන් බැහැර අතිරේක මට්ටමේ විෂය සමගාමී ක්‍රියාකාරකම් | 25 | |
| පෞරුෂත්වය | 05 | |
| එකතුව | 100 | |

(විභාග විෂය නිර්දේශය උපලේඛන අංක 02හි දැක්වේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ............
දිනය : ............

7.3.4.4. 1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත්කිරීම් බලධරයා

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

අභ්‍යන්තර දැන්වීම් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම්

**8.1**

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව /වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන( 03)ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛන අංක 03 ) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03)ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (උපලේඛන අංක 04 ) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05)ක් ගතවීමට පෙර | නිබන්ධනයක් (උපලේඛන අංක 05 ) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?

වසරකට එක් වරක් හෝ දෙපාර්තමේන්තු අවශ්‍යතාවය අනුව

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද ?

1වන කාර්යක්ෂමතා කඩඉම
2වන කාර්යක්ෂමතා කඩඉම } පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරන ලද ආයතනයක් මගින්

3වන කාර්යක්ෂමතා කඩඉම පත්කිරීම් බලධරයා

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...ප.ස/ස.ව/උ.ප/2/33..
දිනය : ...2018/2/18...

## 09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | අදාළ නොවේ. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ වන මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුයි. |
| සන්ධාන භාෂාව | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii . සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ ම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම් අංක 01) අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරේ වසර දහය (10)ක් සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 තනතුරේ II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. එක්සත් රාජධානියේ ගිනි ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකත්ව විභාගය සමත්ව තිබීම.
(Membership Examination of Institution of Fire Engineers – UK)

ii. සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) ක් තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...............
දිනය : ...............

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම් අංක 01) අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම, පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. තනතුරුවලට පත්කිරීම

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | තනතුරේ ස්ථිර කරන ලද II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් II / I ශ්‍රේණියේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරියෙකු වීම. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව ( උපලේඛන අංක 06) |
| ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී | අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරියෙකු වීම | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී තනතුරට පත්කරනු ලැබේ. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ........................
දිනය : ........................

12. බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද , බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගෙන් විමසා කටයුතු කරනු ඇත.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කිරීම : අදාළ නොවේ.

<u>නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කිරීම</u>

මෙම පරිපාටිය ක්‍රියාත්මකවන දිනට නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි (මෙහෙයුම්, ගිනි නිවාරණ) තනතුරේ සේවයේ නියුතු එම තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් / නිදහස් කර ඇති නිලධාරීන් නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරට අන්තර්ග්‍රහණය කිරීම : අදාළ නොවේ.

සටහන

ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය යටතේ වැටුප් පරිවර්තනය කළ යුතු අතර ලබමින් සිටින වැටුප සහ නව වැටුප් පරිමාණයේ වැටුප් පියවර සමාන වන අවස්ථාවලදී අතිරේක වැටුප් පියවරක් දෙනු නොලැබේ. වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැනනගින අවස්ථාවකදී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : [illegible]
දිනය : [illegible]

16. අර්ථ නිරූපණ

<u>සතුටුදායක සේවා කාලය</u>

i. සතුටුදායක සේවා කාලයක් යනුවෙන් අදහස් කරනුයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරී ඉටු කිරීම මගින් ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත් වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයා ගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයා ගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේ ය.

ii. නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක, නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා අඩු කොට නතර කොට හෝ විලම්භනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ , වැරදි පිළිබඳ පළමුවැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක (03) කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක , එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් (01) වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී බැහැර කළ යුතු වන්නේය.

<u>සක්‍රීය සේවා කාලය</u>

" සක්‍රීය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

<u>නියමිත දිනට</u>

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය " නියමිත දිනට" ලෙස අදහස් කෙරේ.ශ්‍රේණි උසස් වීම්වලදී, නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය, කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

උදා : වසර තුන (03) ක දී සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතර (04) කින් සමත් වූවහොත් වසර දහය (10) කින් ලැබිය යුතු උසස් වීම ලැබෙනුයේ වසර එකොළහ (11) කිනි.

සකස් කළේ: අත්සන ............................ 18.05.22

ඒ. කේ. පී. එම්. මෛත්‍රීරත්න
පරිපාලන නිලධාරි
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
කොළඹ 07.

පරීක්ෂා කළේ : ............................ 18.5.23
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

පළාත් පාලන සහකාර කොමසාරිස්
පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය
කොළඹ දිස්ත්‍රික්කය

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය 18.05.30

අත්සන ............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම
තනතුර
නිල මුද්‍රාව

චන්ද්‍රානි සමරකෝන්
පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..............
සභා අංකය : ..............

යොමු අංකය : CM/WP/E15/5/1-26

ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි, නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි හා ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 6/19

අත්සන : ............................
නම : ............................
ලේකම්
පළාත් පාලන අමාත්‍යාංශය (බ. ප.)
නිල මුද්‍රාව

චන්ද්‍රානි සමරකෝන්
ලේකම් (වැ.බ.),
පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා පලප්පවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය
(බස්නාහිර පළාත)

යොමු අංකය : CSWP/PTR/15-3/FI/28(A)

ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි, නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි හා ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2018/11/29

අත්සන : ..............................

නම : ..............................

ප්‍රධාන ලේකම් (බ.ප)

නිල මුද්‍රාව

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය : WPC/PSC/ADM/16/4/33.

ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි, නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි හා ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය 2018.07.17.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ. ප.)

නිල මුද්‍රාව

හේමන්ත සමරකෝන්
ලේකම් (වැ.බ.)
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය : GOS/ADM/4/7/338

ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි, නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි හා ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ....2018/7/18.....දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

දිනය 2018/7/30

අත්සන : ..............................

නම : ..............................

ආණ්ඩුකාර ලේකම්

නිල මුද්‍රාව

පී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/4/7/338
දිනය : 2018/7/18

උපලේඛන අංක 01

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය (ලිඛිත)**

01. විභාගයේ නම :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහාවන බඳවා ගැනීමේ සීමිත තරග විභාගය (ලිඛිත)

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| ගිනි නිවීම් සේවා ඉංජිනේරු, මෙහෙයුම් හා ගිනි සුරක්ෂිතතාව | පැය 03 | 100 | 40 |
| ඉංග්‍රීසි භාෂා හැකියාව | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
පුරප්පාඩු ඇති වූ අවස්ථාවල

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..................
දිනය : ..................

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| ගිනි නිවීම් සේවා ඉංජිනේරු, මෙහෙයුම් හා ගිනි සුරක්ෂිතතාව | I. ගිනි ඉංජිනේරු විද්‍යාව<br>යාන්ත්‍රික විද්‍යාව - Mechanics<br>▪ චලිතය පිළිබඳ නිව්ටන්ගේ නියමයන්, ඒ පිළිබඳ ගැටළු විසඳීම.<br>▪ වේගය,ප්‍රවේගය,ත්වරණය හා ගුරුත්වාකර්ෂණය පිළිබඳ ගැටළු විසඳීම හා අර්ථ දැක්වීම.<br>▪ ශක්ති සංස්ථිතික නියම හා ගැටළු විසඳීම.<br>▪ ඝර්ෂණය හා ගම්‍යතාවය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම.<br>ද්‍රව විද්‍යාව - Hydraulics<br>▪ ඝනත්වය, සාපේක්ෂ ඝනත්වය හා පීඩනය.<br>▪ වායුගෝලීය පීඩනය හා ඒ පිළිබඳ න්‍යාය ධර්ම.<br>▪ (ගිනි නිවීම් සේවාවේදී අදාළ කර ගන්නා අවස්ථා සම්බන්ධයෙන් )<br>▪ ජල ශක්තිය හා කාර්යක්ෂමතාවය ගණනය කිරීම.<br>▪ පීඩන ශක්තිය ,චාලක ශක්තිය බවට පරිවර්තනය වීම පිළිබඳ අවබෝධය හා ජලනල භාවිතයේ දී ඇති වන ප්‍රයෝගික ගැටළු පිළිබඳ අවබෝධය |

විද්‍යුතය - Electricity

- විද්‍යුත් ධාර ගමන් කිරීමට විද්‍යාත්මක විග්‍රහය
- Switch board,fuse board,circuits breakers පිළිබඳ අවබෝධය
- ඕම්ගේ නියමය හා ඒ පිළිබඳ ගැටළු විසඳීම
- විද්‍යුතය භාවිතය,මෝටර් භාවිතය හා වියලි කෝෂ පිළිබඳ අවබෝධය.
- Alternative and direct විද්‍යුත් ධාර පිළිබඳ අවබෝධය.
- වෝල්ටීයතාවය
- ශක්තිය හා තාපය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම.

තාපය - Heat

- විශිෂ්ඨ තාපය (Specific heat)
- ගුප්ත තාපය (Latent heat )
- ශක්ති පරිවර්තන නියමගැටළු විසඳීම
- රේඛීය ප්‍රසාරණතාවය ,ක්ෂේත්‍රවල ප්‍රසාරණතාවය හා පරිමා ප්‍රසාරණතාවය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම.

විකිරණශිලිතාවය - Radioactivity

- විකිරණශීලිතාවය මුලධර්ම හා එහි ප්‍රතිවිපාක
- කිරණ වර්ග හඳුනා ගැනීම හා ඒවායේ ගති ලක්‍ෂණ
- ක්‍ෂය වීම හා අර්ධජීව කාලය පිළිබඳ අවබෝධය
- විකිරණ සුරක්ෂිතතාව

රසායන විද්‍යාව - Chemistry

- පරමාණුක ව්‍යුහය හා මවුලික භාරය ,පරමාණුක භාරය හා වාෂ්ප ඝනත්වය පිළිබඳ අවබෝධය හා ගැටළු විසඳීම.
- රසායනික සංයෝග ,සංයුජතාවය පිළිබඳ දැනුම.
- තුලිත රසායනික සමීකරණ හා Stoichiometric condition හා රසායනික සූත්‍ර පිළිබඳ අවබෝධය
- ජ්වලන අංකය, දහන අංකය හා ස්වයං දහන අංකය පිළිබඳ සම්බන්ධතාවයන් දැන ගැනීම හා අවබෝධය
- දාම ප්‍රතික්‍රියා හා ගිනි නිවීම පිළිබඳ විද්‍යාත්මක විචාරණය.

II. ගිනි නිවීම් සේවා මෙහෙයුම්

- ගිනි නිවීම් තාක්‍ෂණ - Fire Fighiting Technology
- පාලනය හා විධානය - Command & Control
- මෙහෙයුම් භූමි සන්නිවේදන ක්‍රම - Fire Ground Communication
- සිද්ධීන් පාලනය හා විධානය පිළිබඳ ක්‍රමවේදයන් - Incident command & Control
- මෙහෙයුම් භූමි සුරක්ෂිතතාවය - Fire ground Safety
- විශේෂිත අවදානම් ස්ථාන හා ද්‍රව්‍ය පිළිබඳ අවබෝධය - Specific hazadours premises & materials

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ..................
දිනය : ..................

| | |
|---|---|
| | ▪ කර්මාන්ත ආශ්‍රිත ගිනි මෙහෙයුම් හා පද්ධති පිළිබඳ අවබෝධය - Industrial Premisses<br>▪ ස්වභාවික විපත් හා ගොඩනැගිලි කඩා වැටීම් හා ගංවතුර බලපෑම් - Natural disasters<br>▪ සන්නිවේදන හා කණ්ඩායම් ස්ථානගත කිරීම - (Communication & Mobilisation)<br>▪ පොම්ප හා ජල උරාගන්නා උපකරණ - (Pump & Primers)<br>▪ මෙහෙයුම් භූමියක පොම්ප ස්ථාන ගත කිරීම.<br>▪ නඩත්තු කටයුතු<br>▪ ගිනි නිවීම් සේවා වාහන - (Fire Service Vehicles)<br>▪ ගිනි නිවීම් සේවා උපකරණ - (Fire Service Equipment)<br>▪ ගිනි නිවන පෙන හා මාධ්‍ය වර්ග -(Fire Fighing Foam & Other media)<br>▪ ගිනි නිවීම් සේවා ඉනිමං - (Fire Service Ladders)<br>▪ විශේෂිත මෙහෙයුම් (රසායනික ද්‍රව්‍ය ඉහිරීම කාන්දුවීම වැනි සිද්ධීන්) - (Special Operations - Chemical Incidents)<br>▪ මුදාගැනීමේ මෙහෙයුම් හා උපකරණ - (Rescue Operations & Equipment)<br>▪ මෙහෙයුම් අවස්ථාවල දී තීරණ ගැනීම් ක්‍රමවේදය - (Dynamics Decision Making Process) |
| | III.ගිනි සුරක්ෂිතතාව<br>▪ ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය හා ගිනි අවස්ථාවන්හි ඒවායේ හැසිරීම හා අවදානම් තත්ත්වය - Building construction<br>▪ ස්ථාවර ගිනි නිවීම් පද්ධති - Fixed Installations<br>▪ ගිනි ප්‍රවේශම් හා භාවිතය පිළිබඳ දැනුවත්භාවය - Fire Safety Practices<br>▪ ගිනි අනතුරු ඇති වීමට හේතු සෙවීම හා නිවාරණ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ අවබෝධය<br>▪ Public awareness - මහජනයා ගිනි අනතුරෙන් මුදවා ගැනීමේ ක්‍රම වේදයන්<br>▪ දැනුවත් කිරීම |
| ඉංග්‍රීසි භාෂා<br><br>හැකියාව | වාර්තා රචනය (Report Writting)<br>▪ තොරතුරු සොයා ගැනීම - Findings<br>▪ නිගමනයන් - Conclusion<br>▪ නිර්දේශයන් ඉදිරිපත් කිරීම - Recommendations<br>▪ ඉහළ කළමනාකාරිත්වය වෙත වාර්තාව ඉදිරිපත්කිරීම - Presenting to Senior Management<br><br>අවබෝධය<br>▪ වාක්‍ය කාණ්ඩයක් හෝ ජේදයක් කියවා දළ අදහස ලිවීම<br>▪ Write a short note /summary<br>▪ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම<br>▪ Answer the given Questions |

| | |
|---|---|
| | <u>ව්‍යාකරණ අවබෝධය</u><br>▪ රචනා ලිවීම - Essay Writing<br>▪ රාජකාරි ලිපි ලිවීම - Formal letter writting<br>▪ විද්‍යුත් තැපැල් ලිවීම - Email Writting<br>▪ වාක්‍ය කාණ්ඩ ලිවීම - Grammer Evaluation |

අත්සන ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ........................................
තනතුර ........................................
දිනය ........................................
නිලමුද්‍රාව ........................................

චන්ද්‍රානි සමරකෝන්
පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත.

2018.05.29

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...........
දිනය : ...........

උපලේඛන අංක 02

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (සීමිත)**

01. පරීක්ෂණයේ නම :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (සීමිත)

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍රය | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ඉංග්‍රීසි මාධ්‍යයෙන් රාජකාරි විෂයට අදාළව වාචික ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය (එක් පිළිතුරකට ලකුණු 08 බැගින්)<br>• ගිනි නිවීම් සේවා ස්ථාන පාලනය සහ මානව සම්පත් කළමනාකරණය (Fire Station Administration & Human Resource Management)<br>• මෙහෙයුම් ස්ථාන පාලනය (Incident Command – Eg : Fire Rescue, Urban Search & Rescue,Road & Railway Traffic Incident)<br>• ගිනි නිවාරණ සැලසුම් හා ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳ විග්‍රහයන් (Fire Prevention & International Standards)<br>• අන්තරාකාරී ද්‍රව්‍ය අන්තර්ගත සිද්ධීන් සහ මහජන සුරක්ෂිතතාවය (hazardous Material Involved Incident & Public Safety )<br>• මෙහෙයුම් කණ්ඩායම් සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය (Operation Crew's Health & Safety ) | 40 | |
| සේවා කාලය තුළ ඇගයීම් හා ආයතනයට දක්වන ලද දායකත්වයන් සඳහා<br>(එක් දායකත්වයකට ලකුණු 06 බැගින් උපරිමය අවස්ථා 05ක් සඳහා)<br>(සාමාන්‍ය රාජකාරිවලට පරිබාහිර විෂයට අදාළ සුවිශේෂී කාර්යයන් /ජාතික වශයෙන් ඇතිවන ආපදා තත්ත්වයන් හිදී දක්වන සුවිශේෂී දායකත්වයන්) | 30 | 40 |
| සේවා පරිසරයෙන් බැහැර ජාතික මට්ටමේ විෂය සමගාමී ක්‍රියාකාරකම් | 25 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...........
දිනය : ...........

| | | |
|---|---|---|
| • සම්පත් දායකත්වය ( රජයේ විශ්ව විද්‍යාල, රජයේ අනුබද්ධ උසස් අධ්‍යාපන තාක්‍ෂණ ආයතනවල)<br><br>• රජයේ පිළිගත් උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන වෘත්තීය සංවර්ධන පාඨමාලා සහතික පත්‍රය (පැය 50ට වැඩි)<br><br>• සෞඛ්‍ය හා ප්‍රවේශම පිළිබඳ උසස් පාඨමාලා සහතික | | |
| පෞරුෂය | 05 | |
| එකතුව | 100 | |

03. සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
පුරප්පාඩු ඇති වූ අවස්ථාවල

සකස් කළේ : අත්සන ............................ 15-05-22
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ............................
තනතුර : ............................
දිනය : ............................

ඒ. කේ. ජී. එම්. මෛත්‍රීරත්න
පරිපාලන නිලධාරී
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
කොළඹ 07.

පරීක්ෂා කළේ : අත්සන ............................ 18.05.22
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : ............................
තනතුර: ............................
දිනය : ............................

අත්සන ............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ............................
තනතුර ............................
දිනය ............................
නිලමුද්‍රාව ............................

චන්ද්‍රානි සමරකෝන්
පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත.

18.05.29

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ............................
දිනය : ............................

උපලේඛන අංක 03

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුර සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත)**

01. විභාගයේ නම :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුර සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත)

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| ආයතන කාර්ය පරිපාටිය | පැය 02 | 100 | 40 |
| ගිනි නිවීම් ඉංජිනේරු විද්‍යාව | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
වසරකට එක් වරක් හෝ දෙපාර්තමේන්තු අවශ්‍යතාවය අනුව

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පරිපාටිය | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා ආයතන සංග්‍රහයේ VII,XII,XIII,XVII,XXIII,XXIV,XXV,XXVII,XXVIII,XXX, XXXI , XXXII, XXXIII ,XLVII ,XLVIII පරිච්ඡේද ආශ්‍රයෙන් සකස් කළ ප්‍රශ්න පත්‍රයකි |
| ගිනි නිවීම් ඉංජිනේරු විද්‍යාව | 1. ගිනි ඉංජිනේරු විද්‍යාව<br>2. ගිනි නිවීම් සේවා මෙහෙයුම්<br>3. ගිනි සුරක්ෂිතතාව |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ........................
දිනය : ........................

අත්සන ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ........................................ චන්ද්‍රානි සමරකෝන්
තනතුර ........................................ පළාත් පාලන කොමසාරිස්
දිනය ........................................ බස්නාහිර පළාත
18.05.29

උපලේඛන අංක 04

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුර සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත)**

01. විභාගයේ නම :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුර සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත)

02. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණ |
|---|---|---|---|
| කළමනාකරණය | පැය 02 | 100 | 40 |
| නීතිය | පැය 03 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
වසරකට එක් වරක් හෝ දෙපාර්තමේන්තු අවශ්‍යතාවය අනුව

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණය | මානව සම්පත් කළමනාකරණය සිද්ධි කළමනාකරණය සම්බන්ධව දැනුම පරීක්ෂා කර බැලීම සඳහා වන රචනාමය ප්‍රශ්න පත්‍රයකි. |
| නීතිය | මහානගර සභා පනත, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ,ගිනි නිවීම් සේවාව සම්බන්ධ අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ...ගො.ස/147~1/2/2/3/6...
දිනය : ...2021.5.2.18...

අත්සන ......H......
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම ...චන්ද්‍රානි සමරකෝන්...
තනතුර...පළාත් පාලන කොමසාරිස්...
දිනය ...බස්නාහිර පළාත...
18.05.29

උපලේඛන අංක 05

**<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුර සඳහාවන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත)</u>**

01. විභාගයේ නම :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුර සඳහාවන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත)

02. විභාගය පිළිබඳ විස්තර
ගිනි නිවීම් සේවා ක්‍රියාත්මක කිරීම කළමනාකරණය, වර්තමානයේ දී හා අනාගතයේ දී මුහුණ දීමට සිදුවන අභියෝග හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් වචන 5000කට නොඅඩු නිබන්ධනයකි.

03. පවත්වනු ලබන බලධරයා : අදාළ නිබන්ධනය ඉදිරිපත් කළ පසු පත්කිරීම් බලධරයා විසින් කාර්යක්ෂමතා කඩඉම නිදහස් කරනු ලැබේ

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය අනුව

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය : අදාළ නොවේ.

අත්සන ..........H..........
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම ..........
තනතුර .......... චන්ද්‍රානි සමරකෝන්
දිනය .......... පළාත් පාලන කොමසාරිස්
නිලමුද්‍රාව .......... බස්නාහිර පළාත.
18.05.29

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..........
දිනය : ..........

උපලේඛන අංක 06

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරට පත් කිරීම සඳහාවන**

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

01. පරීක්ෂණයේ නම :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරට පත් කිරීම සඳහාවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරේ සේවා කාලය (එක් පූර්ණ අවුරුද්දකට ලකුණු 10 බැගින් උපරිම වසර 05ක කාලය සඳහා) | 50 | 50 |
| රාජකාරියට අදාළව දෙස් විදෙස් පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය හා පුහුණු පාඨමාලා සඳහා සම්පත් දායකත්වය ( එක් කරුණකට ලකුණු 05 බැගින්) | 45 | |
| පෞරුෂය | 05 | |

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා :
පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :
පුරප්පාඩු ඇති වූ අවස්ථාවල

සකස් කළේ : අත්සන ............ 18.05.22
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම ඒ.කේ.ජී.එම්. මෛත්‍රීරත්න
තනතුර පරිපාලන නිලධාරි
පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)
කොළඹ 07.
දිනය ............

පරීක්ෂා කළේ : අත්සන ............ 18.05.23
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම ............
තනතුර ............
දිනය ............

අත්සන ............
(දෙපාර්තමේන්තු ප්‍රධානි)
නම ............
තනතුර චන්ද්‍රානි සමරකෝන්
දිනය පළාත් පාලන කොමසාරිස්
නිලමුද්‍රාව බස්නාහිර පළාත.
18.05.29

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ............
දිනය : ............

ඇමුණුම : 01

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරි තනතුරේ ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහාවන අයදුම්පත**

1. නිලධරයා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................

1.2 හැඳුනුම්පත් අංකය : ..........................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..........................................................

1.4 අයත් වන සේවය හා තනතුර : ..........................................................

1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..........................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්කිරීම් දිනය : ..........................................................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..........................................................

2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම් හා සමත් වූ දිනයන් :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ..........................
දිනය : ..........................

3. උසස්වීමට අදාළ තොරතුරු

3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : **II /I**

3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.3 සක්‍රීය සේවා කාලය

3.3.1 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3.2 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ......................................

3.3.3 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත
උසස් වීමට පූර්වාසන්න පස් (05) වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

4. <u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී තනතුරේ II / I ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ............................................ ........................................................

නිලධාරියාගේ අත්සන

5. <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියළුතොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඉහත නම් සඳහන් .............................................මහතා සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී ...........................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත්වෙමි.ඒ අනුව එම නිලධාරියා ඉහත තනතුරට උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නිල මුද්‍රාව : ......................................

6. <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් /නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / නොවන බවත්, කාරුණිකව දන්වමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ..............................

අත්සන : ................................

නිල මුද්‍රාව : ............................

7. <u>ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,ඒ අනුව ........................................................

මහතා.සහකාර ප්‍රධාන ගිනි නිවීම් නිලධාරී සේවා ගණයේ ........................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය /යටතේ ........................... දින සිට උසස් කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................

නිල මුද්‍රාව ........................